හිතවත් බැංකු ගනුදෙනුකරුවනි,

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද පාරිභෝගික ප්‍රඥප්තිය යටතේ දැක්වෙන නියමයකට අනුව, අපගේ බැංකුව විසින් මූලික කරුණු අන්තර්ගත ලේඛන (Key Fact Documents) මාලාවක් සකස් කර ඇති අතර. ඔබට අවශ්‍ය වන සහ ඔබට සුදුසු වන පරිදි අපගේ බැංකුව විසින් සපයන බැංකු පහසුකම්/සේවාවන් තෝරාගැනීම පිණිස ඔබට සහාය වීමට එකී ලේඛන මාලාවෙන් අපේක්ෂා කරනු ලැබේ.

නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් හි තිබෙන නේෂන්ස් සැලරි සේවර් ගිණුම (Nations Salary Saver Account) පිළිබඳව පුළුල් සංක්ෂිප්ත විස්තරයක් මෙම මූලික කරුණු අන්තර්ගත ලේඛනයෙන් ඔබ වෙත සපයනු ලැබේ.

කෙසේ වුව ද, මෙම මූලික කරුණු අන්තර්ගත ලේඛනයේ සඳහන් මතු සඳහන් කාරණාවන් නෛතික සහ නියාමන වෙනස්කම්වලට අනුව සහ අපගේ බැංකුවේ ප්‍රතිපත්තිවල සහ කාර්ය පටිපාටිවල සිදුවන වෙනස්මිවලට අනුකූලව ප්‍රතිශෝධනය වීමක් අවශ්‍ය වන බව කරුණාවෙන් සලකන්න.

මේ පිළිබඳව වැඩිමනත් තොරතුරු ලබාගැනීමට ඔබ අපේක්ෂා කරන්නේ නම්, කරුණාකර www.nationstrust.com වෙබ් අඩවියට පිවිස හෝ 4 711 411 දරන දුරකථන අංකයෙන් හෝ පැය 24 පුරා ක්‍රියාත්මක ඇමතුම් මධ්‍යස්ථානය ඔස්සේ අප බැංකුව ඇමතීමට කාරුණික වන්න.

නේෂන්ස් සැලරි සේවර් ගිණුම (Nations Salary Saver Account) සම්බන්ධයෙන් හෝ ආශ්‍රිත සේවාවක් සම්බන්ධයෙන් යම් කවරම වූ පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට ඔබට ඇත්නම්, එම පැමිණිල්ල පිළිබඳ දැන්වීම අඩංගු ලුහුඬු ලිඛිත ප්‍රකාශයක්;

**පැමිණිලි විසඳීමේ නිලධාරී, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී, අංක 242, යූනියන් පෙදෙස, කොළඹ 02** යන ලිපිනයට භාරදීමෙන් හෝ අංක 011 4711411 ඔස්සේ අප ඇමතීමෙන් හෝ customersesrvice@nationstrust.com යන විද්‍යුත් තැපැලට යොමු කිරීමෙන් දැනුම් දිය හැකි අතර, ඒ පිළිබඳව අප බැංකුව විසින් ඔබ වෙත ක්ෂණිකව ප්‍රතිචාර දක්වන්නෙමු.

# නේෂන්ස් සැලරි සේවර් ගිණුම (Nations Salary Saver Account) පිළිබඳව මූලික කරුණු අන්තර්ගත ලේඛනය

| ගිණුම පිළිබඳ විස්තරය | ගිණුමෙන් අත්වන ප්‍රතිලාභ | බැංකු ගණුදෙනුකරුවන්ගෙන් අයකරන ගාස්තු / අයකිරීම් / කොමිස් මුදල් / පොලී | මෙම පහසුකම ලබාගැනීම පිණිස අනුගමනය කළ යුතු කාර්ය පටිපාටි | ප්‍රධාන නියමයන් සහ කොන්දේසි |
|---|---|---|---|---|
| නේෂන්ස් සැලරි සේවර් ගිණුම (Nations Salary Saver Account) ජ්<br><br>• නේෂන්ස් සැලරි සේවර් ගිණුමක් පවත්වාගෙන යන අවස්ථාවක දී, බැංකු ගණුදෙනුකරුවන්ට තම වැටුප නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී වෙත ප්‍රේෂණය කර, ප්‍රතිලාභ බොහෝමයක් අත්කර ගත හැකිය.<br><br>• එකිනෙක හා සම්බන්ධ වන පරිදි ඉතිරි කිරීමේ ගිණුමක් සහ ජංගම ගිණුමක් විවෘත කිරීමට මෙයින් ඉඩ සැලසේ. | • බැඳි පොලී අනුපාත<br><br>• ණය කාඩ්පත් - සම්බන්ධ වීමේ ගාස්තු රහිතව සහ 1 වන වසර සඳහා වාර්ෂික ගාස්තු අත්හැරීමක් සහිතව ඇමරිකන් එක්ස්ප්‍රස් ගෝල්ඩ් ණය කාඩ්පත සහ ප්ලැටිනම් මාස්ටර් ණය කාඩ්පත.<br><br>• හර කාඩ්පත- 1 වන වසර සඳහා ගාස්තු අත්හැරීමක් සහිතව සහ සම්බන්ධවීමේ ගාස්තුව රහිතව නේෂන්ස් පොපින් හර කාඩ්පත.<br><br>• ගාස්තු රහිත එක් ස්ථාවර උපදෙස් සැලැස්මක් | නඩත්තු ගාස්තු නොමැත.<br><br>• අවම වැටුප් අවශ්‍යතාව අනුව මාසික වැටුප ප්‍රේෂණය නොකරන බැංකු ගනුදෙනුකරුවන්ගෙන් එපරිදි වැටුප ප්‍රේෂණය නොකිරීම සඳහා මාසික පදනමකින් ගාස්තු අයකරනු ලැබේ.<br><br>***නේෂන්ස් සැලරි සේවර් වැටුප :***<br>*ශ්‍රී.ල.රු. 10,000/- ට පහළ වැටුප් ප්‍රේෂණ සඳහා මසකට ශ්‍රී.ල.රු. 250/-ක් අයකරනු ලැබේ.*<br>***නේෂන්ස් ඉනර් සර්කල් :***<br>*ශ්‍රී.ල.රු. 75,000/- ට පහළ වැටුප් ප්‍රේෂණ සඳහා මසකට ශ්‍රී.ල.රු. 1,000/-ක් අයකරනු ලැබේ.* | • පොදු ව්‍යාපාර කොන්දේසි, MIS ආකෘතිය සමග ගිණුමක් විවෘත කිරීමේ සම්මත මැන්ඩේට් පත්‍ර සම්පූර්ණ කොට (නිසි පරිදි අත්සන් තබා.) පහත සඳහන් ලේඛන සමග බැංකුවේ ඕනෑම ශාඛාවකට භාර දිය යුතුය.<br>• තහවුරු කොට සහතික කළ වැටුප් පත්‍රිකාවක් සපයා නොමැති විටක දී, දළ වැටුපේ ප්‍රභේදනය පැහැදිලිව සඳහන් කරමින් වැටුප තහවුරු කිරීමේ ලිපියක්.<br>• සමාගමේ රබර් මුද්‍රාව යොදා මෙම ලේඛනය සේවායෝජකයා විසින් සහතික කළ යුතුය.<br>• වලංගු ජාතික හැඳුනුම්පතේ පිටපතක් (ගමන් බලපත්‍රය භාරනොගන්නා අතර, වලංගු ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීම මත පමණක් ගිණුමක් විවෘත කළ හැකිය.)<br>• මැන්ඩේට් පත්‍රයේ ලබා දී ඇති ස්ථිර ලිපිනය තහවුරු කරගැනීම පිණිස උපයෝගිතා බිල්පත්/බැංකු ප්‍රකාශ/වරිපනම් රිසිට්පත් රජයේ ආයතනයක ලිපි අවශ්‍ය වේ. (පූර්වාසන්න මාස **3** ක කාලසීමාවක් තුළ දී ලබාගත් ලේඛන විය යුතුය.)<br>• අයදුම්කරු ඊපීඑෆ්/ඊටීඑෆ් අරමුදල්වලට දායක නොවන්නෙකු නම් ඔහු/ඇය පූර්ණ කාලීන සේවයේ නියුතු සුදුසුකම්ලත් වෘත්තිකයෙකු විය යුතුය. (CIMA, ACCA, CIM, IESL, වාස්තු විද්‍යාඥයෙක, ICA, CFA, වෛද්‍ය සභාවේ වෛද්‍යවරයකු හෝ ඊට සමාන වෙනත් සුදුසුකම් ලබාගෙන තිබිය යුතුය.) | **යෝග්‍යතාව සඳහා තැනැත්තන්**<br><br>• වයස අවුරුදු 18 ඉක්ම වූ වලංගු ජාතික හැඳුනුම්පතක් හිමි ශ්‍රී ලංකාවේ පුරවැසියන් වීම.<br>• අයදුම්කරු ශ්‍රී.ල.රු. 20,000/- ක් හෝ ඊට ඉහළ වැටුපක් මාසිකය නිතිපතා උපයන *රැකියාවක් කරන තැනැත්තෙකු වීම.*<br>• අයදුම්කරු සේවක අර්ථ සාධක අරමුදල්වලට දායක වන්නෙකු වීම සහ/හෝ සුදුසුකම්ලත් වෘත්තිකයෙකු වීම (CIMA, ACCA, CIM, IESL, වාස්තු විද්‍යාඥයෙක, ICA, CFA, වෛද්‍ය සභාවේ වෛද්‍යවරයකු හෝ පිළිගත් වෙනත් සුදුසුකම් ලබාගෙන තිබීම.) සහ/හෝ විශ්‍රාම වැටුප් සහිත සහ/හෝ සේවක අර්ථ සාධක අරමුදල් අඩුකිරීම්වලට විෂය වන රජයේ සේවකයෙකු වීම.<br><br>**වෙනත් තොරතුරු නියමයන් සහ කොන්දේසි**<br><br>• ආරම්භක තැන්පතුවක් අවශ්‍ය නොවේ. (එසේ වුව ද, වැටුප එළඹෙන දින **30** තුළ දී ගිණුමට බැර කළ යුතුය.)<br><br>• වැටුප පහත සඳහන් අන්දමට නේෂන්ස් සැලරි සේවර් ගිණුමට බැර කළ හැකිය :- එළඹෙන දින **30** තුළ, වැටුප් පත්‍රිකාවක් හරහා/SI ආකෘතිය හෝ වෙනත් බැංකු ගිණුමක් හරහා හෝ --- ගිණුමට (නාමය) නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ කළමනාකාරවරයා නමින් ලියන ලද චෙක්පත් තැන්පත් කිරීම හරහා සේවායෝජකයා විසින් ගිණුමට මුදල් මාරුකිරීමක් මගින් බැර |

| | | | | |
|---|---|---|---|---|
| | | | | කළ හැකිය.<br>• ජංගම ගිණුමක් විවෘත කිරීමට වරණයක් තිබිය හැකිය. බැංකු අයිරා පහසුකම් ලබාගැනීම පිණිස නේපන්ස් සැලරි සේවර් ගිණුමක් විවෘත කිරීම අනිවාර්ය වේ. සාමාන්‍ය පුද්ගලික ගිණුමක් විවෘත කිරීමේ කාර්ය පටිපාටිය අදාල වේ.<br>• නේපන්ස් සැලරි සේවර් ගිණුමක් පමණක් විවෘත කිරීමට බැංකු ගණුදෙනුකරුවෙකුට වරණයක් තිබිය නොහැකිය.<br>• වැටුප අනුගාමී මාස **3** ක කාලයක් සඳහා නේපන්ස් සැලරි සේවර් ගිණුමට බැර නොකරන විටක දී, නේපන්ස් සැලරි සේවර් ගිණුමේ ප්‍රතිලාභවලට ඇතුළත් කරගනු නොලැබේ. |